# ICCP/ SL/PP/ 083

## මව්පියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය දරුවන්ගේ මනෝ සමාජයීය සංවර්ධනය කෙරෙහි බලපාන ආකාරය අධ්‍යයනය කිරීම

තිසේරා නි.

*ජාතික අන්තරායකර ඖෂධ පාලන මණ්ඩලය*
*nilupnstissera@gmail.com*

**පසුබිම** : දරු ප්‍රසුතියට පෙර එනම්, පූර්ව ප්‍රසව අවධියේ දී, බහුවිධ මත්ද්‍රව්‍ය සඳහා නිරාවරණය වූ මව්වරුන්ගේ දරුවන් සඳහා ඇතිවන විවිධ බලපෑම් හේතුවෙන් එම දරුවන්ට කායික සංවර්ධනයෙහි සහ මනෝ සමාජයීය සංවර්ධනයෙහි දුර්වලතා ඇතිවන බව විවිධ පර්යේෂණ මඟින් සනාථ කර ඇත. දෙමව්පියන් අතර පවතින මත්ද්‍රව්‍ය දුර්භාවිතය ළමා සංවර්ධනයෙහි සෙසු අවධීන් සඳහා ද අවදානම් සහගත වේ. ඒ අනුව, දෙමව්පියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ළමයින්ගේ මනෝ සමාජයීය සංවර්ධනය කෙරෙහි සිදු කරන බලපෑම කෙබඳු ද? යන පර්යේෂණ ගැටලුව මුල්කරගෙන, ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ විස්තරාත්මක පර්යේෂණයක් වශයෙන් කොළඹ දිස්ත්‍රික්කය හා කළුතර දිස්ත්‍රික්කය ආශ්‍රිතව තෝරාගත් සිද්ධීන් යොදාගෙන මෙම අධ්‍යයනය සිදු කරන ලදි.

**ක්‍රමවේදය**: අරමුණු සහගත නියැදිය යටතේ, මත්ද්‍රව්‍ය භාවිත පවුල් 08 ක් නියැදිය සඳහා යොදා ගත් අතර ප්‍රත්‍යෙක අධ්‍යයන ක්‍රමය යටතේ ගැඹුරු සම්මුඛ සාකච්ඡා ඔස්සේ දත්ත රැස් කරන ලදි. ගුණාත්මක දත්ත තේමාත්මක අන්තර්ගත විශ්ලේෂණය අනුව විශ්ලේෂණය කරන ලදි.

**ප්‍රතිඵලය** : මෙම අධ්‍යයනයේ අනාවරණ අනුව, මව්පියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ළමා සංවර්ධනය සඳහා ප්‍රධාන අවදානම් සාධකයක් වන අතර එම දරුවන් අතර නව යොවුන් වියේ සහ තරුණ වියේ දී මත්ද්‍රව්‍ය ගැටලු ඇති වීමේ අවදානම ඉහළ නංවා ඇති අතර දරුවන්ගේ පෞරුෂ සංවර්ධනය තුළ දී අන්තර් පුද්ගල සබඳතා, චර්යාමය ගැටලු ඇති වීම වර්ධනය වී ඇත. මත්ද්‍රව්‍ය භාවිත කරනු ලබන පවුලක් තුළ දරුවන්ට මුහුණ පෑමට සිදුවන ගැටලු හේතුවෙන් එහිදී ලැබෙන ඍණාත්මක ජීවන අත්දැකීම් ආකල්ප සංවර්ධනය කෙරෙහි බලපෑම් ඇති කරන අතර  බිඳුණු පවුල් වර්ධනය වීම නිසා එය දරුවන්ගේ පෞරුෂ සංවර්ධනය කෙරෙහි ලබපා ඇත. විශේෂයෙන්, දරුවාට පවුල තුළින් හිමි විය යුතු රැකවරණය, ආදරය, කරුණාව, අවධානය, වයසට සරිලන ලෙස පිළිගැනීම අඩු වී ඇත. දෙමාපියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පවුල තුළ ආර්ථික ගැටලු ඇති කිරීම හේතුවෙන් දරුවන් පාසල් අධ්‍යාපනය මඟහැර ක්‍රියා කිරීමට පෙළඹීම, දරුවන් නීතිවිරෝධී ක්‍රියාවලට යොමු වී මුදල් ඉපැයීමට යොමු වීම, දරුවන් මන්දපෝෂණ තත්ත්වයට පත්වීම වැනි ප්‍රජා සෞඛ්‍ය ගැටලු පවා ඇති වන බව අනාවරණය විය. එසේම, මත්ද්‍රව්‍ය භාවිතය නිසා ගොඩනැගුණු බිඳුණු පවුල් පසුබිමක දරුවාගේ විභව්‍යතා ප්‍රතික්ෂේප වීම පසුකාලීන ජීවිතය කෙරෙහි හීන පෞරුෂ ලක්ෂණ ඇති වීමට හේතු වේ.

**නිගමනය**: අධ්‍යයනය තුළ දී මත්ද්‍රව්‍ය භාවිත පවුලෙහි සිටින දරුවන්ට ආදරය, පිළිගැනීම, සමාජ සබඳතා පැවැත්වීමට උදවු කිරීම ආදී සමාජ සංවර්ධනය යහපත් හා ගුණාත්මක බවට පත් කිරීම වෙනුවට එවැනි සාධක ගිලිහී යාමක් පැවති බව හඳුනා ගත හැකි විය. මේ අනුව, දෙමව්පියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය දරුවන්ගේ පෞරුෂ සංවර්ධනය, ආකල්ප සංවර්ධනය, සමාජයීය සංවර්ධනය හා චිත්තවේග සංවර්ධනය යන සංවර්ධන පැතිකඩයන්ට බලපෑම් සිදුකර ඇති බව පර්යේෂණයේ අනාවරණය අනුව නිගමනය කළ හැක.

**මුඛ්‍ය පද** : ළමයා, මනෝ සමාජයීය සංවර්ධනය, පෞරුෂය, මත්ද්‍රව්‍ය, පවුල